# දුමින්දාගමනය සමග ලක්දිවට පැමිණි විල්ලිදුර පරපුර පිළිබඳ පුරා මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්

සඳරැසී සුදුසිංහ1

අදින් වසර දෙදහස් පන්සිය පනස් අටකට පෙර ඉන්දියාවේ සිට ලංකාවට බුදුදහම ලැබිණි. මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛ ධර්මදූත පිරිස බුදුදහම රැගෙන ආ අතර, එය මහින්දාගමනයයි. (මහාවංශය 14 පරිච්ඡේදය) ලංකාවට බුදුදහම ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස සංඝමිත්තා තෙරණියගේ ලංකා ගමනය සිදුවිය. ඒ සමග ඉන්දියාවේ සිට ශ්‍රී මහා බෝධි ශාඛාවක් ද ලංකාවට වැඩම කරන ලදී. එය දුමින්දාගමනයයි. (මහාවංශය 19 පරිච්ඡේදය) එහි ප්‍රතිඵලයක් ලෙස භික්ෂුණීන් වහන්සේලා මෙන්ම ශ්‍රේණි දහ අටකට අයත් ශිල්පී පරම්පරාවන් රැසක්ද මෙහි පැමිණියේ ය. එම ශිල්ප ශ්‍රේණිවල ආගමනයේ අභිප්‍රාය වුයේ, ශ්‍රී මහා බෝධියට රැකවරණ පිදීමත්, සියලු පුදසත්කාර සිදුකිරීමත්ය. මේ බව මහා වංශය, සිංහල බෝධිවංශය, සුළු බෝධි වංශය හා ශිලාලේඛන ආදී මූලාශ්‍රවල සඳහන් වේ. එසේ පැමිණි දහඅට කුලයෙන් එක් කුලයක් නියෝජනය කරන්නා වූ විල්ලිදුර පරම්පරාව පිළිබඳ තොරතුරු බොහොමයක් මේ වන විට අප්‍රකාශිතය. ශ්‍රී මහා බෝධිය රැක ගැනීමේ කුල පරම්පරා අතර විල්ලිදුර පරම්පරාවට ලැබෙන්නේ අද්විතීය ස්ථානයකි. ඒ අනුව ඔවුන්ට ආවේණික රාජකාරි ක්‍රම මෙන්ම සංස්කෘතියක්ද බිහි විය. ඔවුන් දුමින්දාගමනය නමැති ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා ආගමික විප්ලවයේ ජීවමාන සාධකයක්ද වන්නේය. එම සංස්කෘතියේ අඩංගු බොහෝ සාධක කාලයත්, පරම්පරාවත් සමඟ ක්ෂයව ගිය ද අදටත් ශ්‍රී මහා බෝධිය සහ විල්ලිදුර පරම්පරාව එකිනෙකට වෙන් කළ නොහැකි සංස්කෘතිකමය බැම්මකින් බැඳී පවතී. ශ්‍රී මහා බෝධිය සමග අවියෝජනීය සබැඳියාවකින් යුත් විල්ලිදුර පරපුරෙහි වර්තමාන තත්වයන් විමසන විට පෙනීයන්නේ, නවීන සමාජය සමග මුහුවීමෙන් ඔවුන්ගේ පාරම්පරික සිරිත් විරිත්, ආකල්ප, සාරධර්ම ආදිය ගතිකත්වයකට ලක්ව ඇති බවයි. ඊට නිදසුන් ලෙස තම පාරම්පරික රාජකාරියේ යෙදීමෙන් මිදී නව රැකියාවන් හි නිරත වීම හා වෙනත් සමාජ වටිනාකම් සොයායෑම දක්වා ලිය හැකිය. නමුත්, අද වනවිටත් විහාර ගම් නවයක ජීවත් වනු ලබන විල්ලිදුර වංශිකයන් තම ජීවිතය ශ්‍රී මහා බෝධිය කෙරෙහිම කැප කොට ඇත. මෙකී විල්ලිදුරයන්ගේ ඉපැරණි සමාජ සන්දර්භය අධ්‍යයනය කිරීම වැදගත්ය. ඒ අනුව ඔවුන්ගේ නාම යෙදීම, රාජකාරි ක්‍රමය, ආවාහ-විවාහ ක්‍රම ආදී සමාජීය අංගයන් පිළිබඳ පුරා මානව වංශ විද්‍යාත්මක අධ්‍යයනයක් කළ යුතු වන්නේය. මෙම අධ්‍යයනය උදෙසා ප්‍රාථමික හා ද්විතික මූලාශ්‍රයන්, එකී ජන කොටස් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා හා සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රම ආදිය තුළින් කරුණු එක්රැස් කොට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පද : විල්ලිදුර පරපුර, දුමින්දාගමනය, කුල ශ්‍රේණි

1 පුරාවිද්‍යා විශේෂවේදී, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ජනමාධ්‍යවේදී
sandarani709@gmail.com